**අපි වෙනුවෙන් අපි අරමුදල - 2018**

**----------------------------------------**

**1.1** **මතය**

අපි වෙනුවෙන් අපි අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

2018 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

**1.4** **මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය

ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන**

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට දුරකතන සමාගම් 07 කින් ලැබිය යුතු සම්ප්‍රේෂණ කුළුණු ආදායම රු.මිලියන 25.92 ක් වුවත් මෙම ශේෂය අදාල දුරකථන සමාගම් වෙතින් තහවුරු කර ගෙන නොතිබුණි. | 2019 ජනවාරි මස රු. 997,734 ක්වූ මුදලක් අයකරගෙන ඇත. | තව දුරටත් අයවිය යුතු රු. මිලියන 24.92 ක මුදල ගිවිසුම ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන අනුව රණජයපුර නිවාස ව්‍යාපෘතියේ නිවාස ලාභීන් 439 දෙනෙකුගෙන් 2018 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවැති හිඟ වාරික මුදල් රු.මිලියන 21.51 ක් විය. වර්ෂ 02 කට ඉක්මවූ හිඟ වාරික රු.මිලියන 12.38 ක්ද, වර්ෂ 05 ඉක්මවූ හිඟ වාරික රු මිලියන 1.93 ක්ද ඊට ඇතුලත් විය. | මේ පිළිබඳව අදාල අංශයන් සමග සම්බන්ධවී ඉදිරියේදී මෙම හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | ගිවිසුම අනුව කටයුතු කරමින් හිග මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**1.7 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2008 අංක 06 දරන අපි වෙනුවෙන් අපි අරමුදල් පනත | | | |

| | | | |
|---|---|---|---|
| (i) 04 වන වගන්තිය | පනතේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීමට අදාල හෝ අනුසාංගික අරමුණක් නොවන වෘත්තීය පුහුණු වැඩසටහන් සහ සුහසාධන චාරිකා සඳහා විශ්‍රාමික ධජ නිලධාරීන්ගේ සංගමයට රු.1,043,500 ක මුදලක් ගෙවා තිබුණි. | පනතේ 5 (1) යටතේ පැවරී ඇති බලය අනුව කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය මත රු. 1,043,500 ක මුදලක් මෙම අරමුදලින් ලබාදීමට කටයුතු කර ඇත. | 2008 අංක 06 දරන අපි වෙනුවෙන් අපි අරමුදල් පනතේ 04 වන වගන්තියේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීමට අදාල හෝ අනුසාංගික අරමුණු සඳහා පමණක් වියදම් දැරිය යුතුය. |
| (ii) (6) වගන්තිය | අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සහ විගණකාධිපති වාර්තාව අරමුදල ආරම්භයේ සිට 2017 වර්ෂය දක්වා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාල ගිණුම් වාර්තා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වරයා වෙත ඉදිරිපත් කර ඇති අතර, ඉදිරියේදී සියළු ගිණුම් වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | 2008 අංක 06 දරන අපි වෙනුවෙන් අපි අරමුදල් පනතේ 11(6) වගන්තිය අනුව කටයුතු කල යුතුය. |
| (ආ) 2014 ඔක්තෝබර් 17 දිනැති 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය සහ මුදල් රෙගුලාසි 756 | අරමුදල සඳහා සමාලෝචිත වර්ෂය අවසානයේ භාණ්ඩ සමීක්ෂණය සිදු කර එම සමීක්ෂණ මණ්ඩල වාර්තා 2019 මාර්තු 17 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණයට මණ්ඩලයක් පත්කර ඇත. සමීක්ෂණය අවසන් වූ විගසම වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | 2014 ඔක්තෝබර් 17 දිනැති 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය සහ මු.රෙ 756 අනුව කටයුතු කල යුතුවේ. |

**1.8** <u>**මුදල් කළමනාකරණය**</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| අරමුදලේ අනාගත මූල්‍ය අවශ්‍යතා පිළිබඳ නිසි සැලැස්මක් පිළියෙල කිරීමකින් තොරව අරමුදල විසින් ස්ථාවර තැන්පතුවක් කල්පිරීමට දින 18 කට පෙර මුදල් කරගෙන තිබුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව බැංකුව විසින් ආයෝජන පොලිය ගණනය කිරීම සඳහා එකගවූ පොලී අනුපාතය වූ සියයට 11 වෙනුවට සියයට 8.25 අනුපාතය මත පොලිය ගණනය කිරීම හේතුවෙන් රු.439,247 ක පොලී ආදායමක් අරමුදලට අහිමිවී තිබූ බව නිරීක්ෂණය විය. | අර්ධ නිවාස ව්‍යාපෘතියේ තෝරාගත් ප්‍රතිලාභීන්ගේ හදිසි මූල්‍යාධාර අවශ්‍යතාවය මත ස්ථාවර තැන්පතුව මුදල් කරගෙන ඇති අතර, අරමුදලේ මුදල් අවශ්‍යතාවයන් සැලැස්මකට අනුව කළමනාකරණය කර ගනිමින් මූල්‍යාධාර නිදහස් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | මුදල් අවශ්‍යතා සැලැස්මක් පිළියල කර මූල්‍ය පාලනය විධිමත් කිරීම අවශ්‍යවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.101,988,572 ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.196,813,687ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 298,802,259ක පිරිහීමක් නිරීක්ෂණය විය. අරමුදලේ ආදායම රු.28,582,415 කින් ඉහල ගියද ව්‍යාපෘති සංවර්ධන වියදම රු.309,756,656 කින් හා ව්‍යාපෘති මෙහෙයුම් වියදම රු. 6,835,752 කින් ඉහල යාම, මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුල රේඛීය අමාත්‍යාංශය යටතේ පවතින සමාගමක් වෙතින් රු මිලියන 10 ක් හා පෞද්ගලික පරිත්‍යාග වශයෙන් රු.362,390 ක මුදලක් අරමුදල වෙත ලැබී තිබුණි.කෙසේ වෙතත්, 2008 අංක 06 දරන අපි වෙනුවෙන් අපි පනතේ 5(2) (1) (අ) වගන්තිය පරිදි අරමුදල තරකර ගැනීමට දේශීය හා විදේශීය ප්‍රභවයන්ගෙන් අරමුදල් රැස් කිරීම, ත්‍යාග හා පරිත්‍යාග භාර ගැනීමේ හැකියාව පවතින නමුත් අරමුදල තර කරගැනීම සඳහා වෙනත් කිසිදු වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි. | ඉදිරියේදි පැවැත්වෙන කළමණාකරන මණ්ඩලය වෙත මෙම යෝජනාව ඉදිරිපත් කිරිමට කටයුතු කර ඒ අනුව කළමණාකරන මණ්ඩල තීරණ පදනම් කරගෙන අරමුදල් ඉහල නැංවීමේ ව්‍යාපෘති කටයුතු කරනු ලැබේ. | 2008 අංක 06 දරන අපි වෙනුවෙන් අපි පනතේ 5(2) (1) (අ) වගන්තිය අනුව කටයුතු කල යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16.2 වගන්තිය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමග කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කල යුතු වුවද අරමුදල විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | අමාත්‍යාංශයට අදාල කාර්යසාධන වාර්තා ඉදිරිපත් කරන විට අපි වෙනුවෙන් අපි අරමුදලට අදාල කාර්යයසාධන වාර්තාවද ඉදිරිපත් කිරිමට කටයුතු කරනු ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16.2 වගන්තිය අනුව කටයුතු කල යුතුය. |

## 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2014 ප්‍රකාරව 2018 වර්ෂය සඳහා දිගුකාලීන දැක්මක් සහිතව අදාල පනතේ සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කරගත් ක්‍රියාකාරකම්, අරමුදලේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ තත්‍ය කාර්ය මණ්ඩලය, වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අරමුදල් අවශ්‍යතා සැලැස්ම ආදී කරුණු ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් අරමුදල විසින් පිළියෙල කර නොතිබුණි. | සම්පූර්ණ හා අර්ධ නිවාස යටතේ ප්‍රතිලාභීන් සංඛ්‍යාව පමණක් දැක්වෙන සැලැස්මක් ඉදිරිපත්කර ඇත. | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අරමුදල සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කල යුතුය. |

## 4.3 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත හා ජනාධිපති ලේකම්ගේ 2018 මාර්තු 16 දිනැති අංක පීඑස්/එස්පී/එස්බී/3/201 දරන චක්‍රලේඛය අනුව අරමුදල විසින් තිරසර සංවර්ධන පනත පිළිබඳ දැනුවත්වී එම අරමුණු කරා ලඟාවීමට අවශ්‍ය ඉලක්ක හඳුනාගෙන එම ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | 2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනතේ සඳහන් අරමුණු ලඟාකර ගැනීමට අරමුදලේ සියළුම අංශ දැනුවත් කර ඇත. | ජනාධිපති ලේකම්ගේ 2018 මාර්තු 16 දිනැති අංක පීඑස්/එස්පී/එස්බී/3/201 දරන චක්‍රලේඛය අනුව කටයුතු කල යුතුය. |